*සැ. යු.* - 2015.01.09 දින පළ වූ අංක 1,897 *දරන ගැසට් පත්‍රයේ* I : III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,898 - 2015 ජනවාරි මස 16 වැනි සිකුරාදා - 2015.01.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 58 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 60 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 62 |

*සැ. යු.* - විසිතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2014 නොවැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 පෙබරවාරි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා, බර ට්‍රොලි සඳහා රෝද සහිත ඇක්සල් 70ක් හා සැහැල්ලු ට්‍රොලි සඳහා රෝද සහිත ඇක්සල් 20ක් ප්‍රසම්පාදනය**

01. ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන), සභාපති විසින් බර ට්‍රොලි, පොම්ප ට්‍රොලි හා රෝද සහිත ට්‍රොලි ඇක්සල් සැපයීම සඳහා, නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

ලංසුකරුවන්හට, තම ලංසු ඍජුවම හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හා ඇටර්නි බලය පැවරූ පත්කළ නියෝජිතයෙකු මගින් ඉදිරිපත්කළ හැකි ය.

2. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 2,500 හෝ නිදහසේ මාරු කළ හැකි සමාන ප්‍රමාණයෙන් යුත් මුදල් වර්ගයකින් ගෙවීමෙන් 2015.02.12 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) පස්වරු 3.00 දක්වා,

ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලින් ලබාගත හැකි ලංසු ලේඛන මගින් පමණක් ලංසු ඉදිරිපත්කළ යුතු වේ.

03. ලංසු භාරගැනීම 2015.02.13 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) පස්වරු 2.00 ට අවසන් කෙරේ.

04. අදාළ රෝද සහිත ට්‍රොලි ඇක්සල් සැලසුම් කොට, නිෂ්පාදනය කොට, සැපයීම කලයුතු වන්නේ, ISO 9001 : 2008 ප්‍රමිතියෙන් සහතිකලත් හෝ ගැණුම්කරුවන්හට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමනාකරණ පද්ධති ප්‍රමිතිය ලත් ආයතන මගින් පමණකි.

05. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ , ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙස ඉල්ලීමක් කෙරේ.

06. මුද්‍රා තැබූ ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.
ශ්‍රී ලංකාව.

07. ලංසු ලේඛන ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී, නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකි අතර, වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අය ඇමතිය හැකි ය.

දුම්රිය ගබඩා අධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කොට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක 94(11) 2438078 හෝ 94 (11) 2473328

යොමු අංකය : SRS/F.7078

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

01-412

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඝනරෝද (Solid Wheels) 600ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F.7204

01. ශ්‍රී ලංකාවේ, කොළඹ, ඕල්කොට් මාවත, තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඝනරෝද (Solid wheels) 600ක් සැපයීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. ඇටෝර්නි බලපත්‍රයක් මගින් බලය පවරන ලද බලයලත් නියෝජිතයෙකු මගින් නිෂ්පාදකයින්හට ලංසු ඉදිරිපත්කළ හැක.

02. 2015.01.15 වැනි දින ප. ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) ලංසු භාරගැනීම අවසන් කෙරේ.

03. ශ්‍රී ලංකා රුපියල් තුන් දහසක (රු. 3,000) ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2014.12.23 වැනි දින සිට 2015.02.10 වැනි දින දක්වා පෙ. ව. 9.00 සහ ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) අතර වැඩ දිනයන්හි ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් ලංසු ලිපිලේඛන සමග ලබාගත හැකි ආකෘති පත් වලින් ලංසු ඉදිරිපත් කළ යුතුයි. විදේශ ලංසු කරුවන් ඉහත සඳහන් දින තුළ දී තම රටේ ඇති ශ්‍රී ලංකා දූත කාර්යාලය වෙත ශ්‍රී ලංකා රුපියල් තුන් දහසකට සමාන මුදලක් පරිවර්තනය කළ හැකි විදේශ මුදලින් ගෙවීමෙන් ශ්‍රී ලංකාවේ ඇති ඔවුන්ගේ දූතකාර්යාලය මගින් ලංසු ලිපිලේඛන ඔවුන් වෙත ලබාදීම සඳහා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරිගෙන් ඉල්ලා සිටිය හැක. රුපියල් තුන් දහසේ (රු. 3,000) (හෝ ඊට සමාන පරිවර්තනය කළ හැකි විදේශ මුදලින් වූ) ඉහත සඳහන් ප්‍රසම්පාදන ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාවේ කොළඹ 10, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී ලංසු විවෘත කෙරේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට සහභාගි විය හැක.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට හෝ හැකි ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර සම්බන්ධ වන්න,

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත,
කොළඹ, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94(11) 2438078 හෝ 94 (11) 2473328
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් තලය : www.railway.gov.lk

යොමු අංකය : SRS/F.7204

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

01-413

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**විස්කොමීටර් බාත් 02ක් හා විස්කොමීටර් ටියුබ් ක්ලීනර් 02ක් ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංක : SRS/F.7190

01. ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා කොළඹ, තැ. පෙ. අංක 355, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, විස්කොමීටර් බාත් 02ක් හා විස්කොමීටර් ටියුබ් ක්ලීනර් 02ක් ප්‍රසම්පාදනය සඳහා, 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතා ප්‍රකාරව සංස්ථාගත කළ සහතිකය සහිත, නිෂ්පාදකයා විසින් පත්කළ දේශීය සැපයුම්කරුවන් වෙතින්, මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

නිෂ්පාදකයන්හට තම ලංසු, ඇටර්නි බලය පැවරූ තම දේශීය නියෝජිත මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාරගැනීම 2015 ජනවාරි මස 22 වැනි දින පස්වරු 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තු රුපියල් 2,500 ගෙවීමෙන්, 2015 ජනවාරි මස 21 වැනි දින පස්වරු 3.00 දක්වා, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ලංසු ලේඛන මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවා මූලස්ථාන කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙස ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තැබූ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
කොළඹ 10.

06. ලංසු ලේඛන ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී, නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර පහත සඳහන් අය අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත,
කොළඹ 10.

දුරකථන අංක 94(11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com

යොමු අංකය : SRS/F.7190

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

01-414

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීමේ නිවේදනය පහත පළ වේ.

සමාගමේ නම : ඕර්එම් සොලුෂන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99197
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 57/එෆ්, කොස්ඉන්න මාවත, කටුවාවල, බොරලැස්ගමුව
සංස්ථාගත කළ දිනය : 2014.06.19

අධ්‍යක්ෂ.

01-415

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : මර්ලින් ෆිෂින් (පීවීටී)එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 102768
ලියාපදිංචි දිනය : 2014 දෙසැම්බර් මස 22
ලිපිනය : අංක 22/2, පැපිලියාන පාර, ගංගොඩවිල, නුගේගොඩ.

සමාගම් ලේකම්වරු.

01-427/1

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : ක්‍රියේටර් ත්‍රීහන්ඩ්‍රඩ් ඇන්ඩ්සික්ස්ටි (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 102894
ලියාපදිංචි දිනය : 2014 දෙසැම්බර් 18
ලිපිනය : අංක 147/2, කොහිලවත්ත, මුල්ලේරියාව නව නගරය.

සමාගම් ලේකම්වරු.

01-427/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : එස් ජේ හෝල්ඩිංස් ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 102178
ලියාපදිංචි දිනය : 2014 නොවැම්බර් මස 17
ලිපිනය : අංක 83 ඒ, කොළඹ පාර, අවිස්සාවේල්ල.

සමාගම් ලේකම්වරු.

01-427/3

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : රිසෝස් ඩිවලොප්මන්ට් සෙන්ටර් කො එල්ටීඩී
සමාගමේ අංකය : පී බී 5233
ලියාපදිංචි දිනය : 2014 නොවැම්බර් 13
ලිපිනය : අංක 84, වටරවුම පාර, කුරුණෑගල දකුණ.

සමාගම් ලේකම්වරු.

01-427/4

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : බී පී ඕ කනෙක්ට් ෂෙයාර්ඩ් සර්විසස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 101735
ලියාපදිංචි දිනය : 2014 ඔක්තෝබර් 27
ලිපිනය : අංක 111, ටී. බී. ජයා මාවත, කොළඹ 10

සමාගම් ලේකම්වරු.

01-427/5

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : අයි ටී කනෙක්ට් සිස්ටම්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 101411
ලියාපදිංචි දිනය : 2014 ඔක්තෝබර් 10
ලිපිනය : අංක 111, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

සමාගම් ලේකම්වරු.

01-427/6

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙහි පහත සඳහන් ඇටෝර්නි බලපත්‍රයෙහි ඇටෝර්නි අධිපති වන නයිනතිච් දැනට තේස්වේජ් 54 වැන්න, 7500, හොල්ස්ටේ බීආර්ඩී, ඩෙන්මාර්ක් යූඩීඑල් අංක 73 - 076-343 හි පදිංචි තනබාලසිංගම් කලාදරන් සහ ජීවාමනී කලාදරන් වන අප විසින් අපගේ ඇටෝර්නි බලකරු ලෙස ගල්කිස්ස, සාන්ත සිල්වෙස්ටර් පාර, අංක 35/1 හි පදිංචි තියාකර් තිරුනවුකරසු යන අය පත්කරමින් 1999.10.29 වැනි දින දරන බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ දිනපොත් අංක 10055 යටතේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 205 වන කාණ්ඩයේ 31 වන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති විදේශීය විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් අප විසින් දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමු.

01-439

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ, 11 (5) වගන්තියට අනුව පහත සඳහන් සමාගම් නාමය වෙනස් වූ බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

පෙර නාමය : සියපත ෆිනෑන්ස් ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : පී බී 917
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02
නම නාමය : සියපත ෆිනෑන්ස් පීඑල්සී
සමාගම් නාමය වෙනස් වූ දිනය : 2014 දෙසැම්බර් 31.

ආර්. එල්. එස්. සේනාරත්න,
සමාගම් ලේකම්.

01-442

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි

සමාගමේ නාමය : බී ආර් සී ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 102789
ලියාපදිංචි ලිපිනය : අංක 127, පන්සල පාර, තලපත්පිටිය, නුගේගොඩ.

චාමික හිරාල් ලියනගේ,
සමාගම් ලේකම්.

01-443

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීමේ නිවේදනය පහත පළ වේ.

සමාගමේ නම : සොනික්මෝ ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102885
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 113/1/1, කොළඹ පාර, පිළියන්දල
සංස්ථාගත කළ දිනය : 2014.12.17

අධ්‍යක්ෂ.

01-461

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානය යටතේ දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාපිත අංක පී වී 102313 දරන මධුක ඉන්ටර්නැෂනල් එඩියුකේෂනල් සර්විස් පුද්ගලික සමාගම, 2014.11.21 වැනි දින සංස්ථාපනය කර අංක 63, කොළඹ පාර, කුරුණෑගල යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබයි.

ජී. එච්. ජී. ආර්. සුරංග බංඩාර,
අධ්‍යක්ෂක.

2014 දෙසැම්බර් මස 23 වැනි දින.

01-363

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන වෙළඳ සමාගම් ආඥාපනතේ 9 (1) ඡේදය අනුව මෙයින් දන්වා සිටින වගනම් -

වෙළඳ සමාගමේ නම : සිංහ භූමි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 103042
ලියාපදිංචි කළ දිනය : දෙදහස් දාහතරේ දෙසැම්බර් මස 26
ලියාපදිංචි කාර්යාලය : අපාට් 513, 2000 ප්ලාසා රෙසිඩන්සීස්, අංක 25 නව රෝහල පාර, ශ්‍රී ජයවර්ධනපුර, නුගේගොඩ.

අධ්‍යක්ෂක.

01-495

---

## සංස්ථාගත කිරීම

සමාගමේ නම : මැක්මාට් (Makmat) කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 102859
ලිපිනය : අංක 214, දෙහිපේ

01-469

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බොරලැස්ගමුව, නීලම්මහර, පරාක්‍රම මාවතේ අංක 227/ඩී පදිංචි දෝන ශ්‍රියා චාන්දනී අබේසිංහ වන මම ලලනි හෙට්ටිගේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2012 දෙසැම්බර් මස 20 වැනි දින ලියා සහතික කළ අංක 1906 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් බොරලැස්ගමුවේ, නීලම්මහර, පරාක්‍රම මාවත, අංක 227/ඩී දරන තැන පදිංචි දෝන චන්දිමා ශාන්තිනී අබේසිංහ වෙත පවරන ලද ඇටෝර්නි බලය 2015 ජනවාරි මස 01 දින සිට අවලංගු කොට බල රහිත කරන බව මෙයින් දන්වා සිටිමි.

එකී දින සිට පෙර කී ඇටෝර්නි බලය යටතේ මාගේ නමින් හෝ මා වෙනුවෙන් ඉහත නම් සඳහන් දෝන චන්දිමා ශාන්තිනී අබේසිංහ විසින් කරනු ලබන කිසිදු ගනුදෙනුවක් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් මා විසින් භාර නොගන්නා බවට ද මෙයින් දන්වා සිටිමි.

දෝන ශ්‍රියා චාන්දනී අබේසිංහ.

01-468

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : ලංකා බීච් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102657
සමාගම සංස්ථාපනය කළ දිනය : 2014.12.08
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 84/1, පලගතුරය නැගෙනහිර, කොච්චිකඩේ

වර්ණකුලසූරිය විවියන් ප්‍රනාන්දු,
සමාගම් අධ්‍යක්ෂ.

01-397

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| | *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය* |
|---|---|---|---|---|
| 1. | අපේක්ෂා විමෙන්ස් හෙල්ත් ෆවුන්ඩේශන් | ජී ඒ 2998 | 2014.12.22 | අංක 01, 03 වැනි හරස් පටුමග, බොරුපන, රත්මලාන. |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-470

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැංකුව පීඑල්සී - කොළඹ කොටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ හෝමාගම ව්‍යාපාර ලියාපදිංචි අංක එන්පීවීඑස් 3781 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඩී. පී. වික්‍රමාආරච්චි ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හෝමාගම පදිංචි දෝන පියසීලි වික්‍රමාආරච්චි යන අය බන්ධනදායින් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම පිහිටි දැන් වරිපනම් අංක 29 දරන පරිශ්‍රයේ අතුරු බෙදීමක් වන එකී ලොට් එක්ස් 1 ඒ දරන කොළඹ බලයලත් මිනින්දෝරු ඩී. පී. ඒ. ජයසිංහ විසින් සාදන ලද 1964 අගෝස්තු මස 26 වැනි දිනැති අංක 2372 දරන සැලැස්මේ නිරූපනය වන කොස්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කළ බෙදාවෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2372 දරන සැලැස්ම අනුව රූඩ් තුනක් (අ. 0 රූ. 3 පර්. 0) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිට සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2015 පෙබරවාරි මස 06 වැනි දින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - හෝමාගම නගරයේ සිට දුම්රියපොල පාර ඔස්සේ මීටර් 500 ක පමණ දුරක් ගොස් දුම්රිය හරස් මග ද පසුකළ විට ඇති පොල හංදිය දක්වා පැමිණ වම්පසට ඇති අතුරුගිරිය පාරට හැරෙන්න. එම අතුරුගිරිය මාර්ගය ඔස්සේ තවත් මීටර් 700 ක පමණ දුරක් ගිය විට ඇති හෝමාගම මහා විද්‍යාලය ද පසුකර ගිය විට අංක 2/2 දරන බෝක්කුව හමුවේ. නැවතත් වමපසට ඇති නගරසීමා මාවතට හැරී තවත් මීටර්

400 ක පමණ දුරක් ගිය විට මාර්ගයේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - *රජයේ ගැසට් පත්‍රයේ* 2013.02.22 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2013.02.18 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2013.02.15 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පලාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ ප්‍රධාන කළමනාකාරිනිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක : 011 2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ /අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011 2572940.

01-456

---

**නිවසක් සහිත ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කඩුවෙල දිසා අධිකරණයේ දී ය.

සණස ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ්,
සීමාසහිත සණස සංවර්ධන බැංකුව යන නාමයෙන් ද හැඳින්වේ.
අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06.

නඩු අංකය : 233/එම්/ ස්වභාවය/ උගස්/නිශ්චල

................................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. හේවා වෙල්ලාලගේ ප්‍රියන්ත, අංක 147,
නිව්සිටි 2, බටකැත්තර, පිළියන්දල.
02. වැලිපිටිය මහරාලලාගේ හසන්ති නිල්මිණි
03. පන්නිලගේ දොන් හිරාන් ප්‍රියංකර, අංක 39/01,
වැලිකොටුව වත්ත, මාකන්දන, මඩපාත.

...........................*විත්තිකරුවන්.*

කඩුවෙල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රයට අනුව ඉහත විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයකර ගැනීමට ඇති රුපියල් අට ලක්ෂ හැත්තෑ නම දහස් හතරයි ශත පනස් හයක (රු. 879,004.56) මුදලක් සහ රුපියල් හත් ලක්ෂ හැත්තෑ පන් දහස් දහයයි ශත විසි හතරක (රු. 775,010.24) මුදලක් හා ඒ මත වර්ෂ 2009.08.24 වැනි දින සිට වර්ෂයකට 24% ක් බැගින් වූ පොලිය ද අයකර ගැනීමට පහත උපලේඛනයේ විස්තර වන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින්, එකී මුදල් අයකර ගැනීමට මෙහි පහත උපලේඛනයේ වඩාත් විස්තර වන පිළියන්දල බටකැත්තර පිහිටි වැලිකොටුව වත්තේ ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම එකයි හයක (පර්. 10.16) ඉඩම සහ එහි පිහිටි නිවස ඇතුලු සියලු දේ ද 2015 පෙබරවාරි මස 10 වැනි දින පෙ. ව. 11.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේදී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය.* - පිළියන්දල නගරයේ සිට හොරණ දෙසට යන විට දකුණු දෙසට ඇති මඩපාත පාරේ ගොස් නින්කමල් කර්මාන්ත ශාලාව අසලින් වමට ඇති එල්. එස්. වත්ත පාරේ පැමිණ බෝගහ අසලින් දකුණට හැරී කනත්ත පසුකර 6 වැනි පටුමගේ නිව්සිටි 2 අංක 147 දරන ස්ථානය වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම දේපළ ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් වෙන්දේසිකරු වන මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරයකින් පමණක් කළයුතු වන අතර චෙක්පත් බාරගනු නොලැබේ.

01. වෙන්දේසිය ප්‍රසිද්ධ කිරීම සඳහා ගැසට් සහ පුවත්පත් දැන්වීම් ඇතුලු වෙන්දේසිය පැවැත්වීමට දරා ඇති සියලුම වියදම්,
02. අදාළ පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු 1% ක වෙළඳ බද්ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකහමාරක් (2 1/2%),
04. විකිණීමේ කොන්දේසි සහතික කිරීමට නීතිඥ ගාස්තු ලිපිකරු සහ සෝෂක ගාස්තු සහ පොලිස් නිලධාරීන්ට බටා මුදල්.

උපලේඛනය

බස්නාහිර පළාත්, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ බටකැත්තර පිහිටි වැලිතොටුවේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් මැන සාදන ලද වර්ෂ 1994 අප්‍රේල් මස 05 වැනි දිනැති පිඹුරු අංක 500 හි ලොට් අංක 148 සඳහා මායිම් උතුරට : ලොට් 143, නැගෙනහිරට : ලොට් 199 (අඩි 6ක් පළල පාර) දකුණට : ලොට් 146 සහ බස්නාහිරට : ලොට් 131 යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම එකයි හයක් (අ. 0 රූ. 0 පර්. 10.16) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ ගොඩනැගිලි යන සෑම සියලු දේත් වේ. මෙකී පිඹුරු අංක 500 ප්‍රකාර ලකුණු කළ ලොට් 199, 202 203, 204, 205, 209 සහ 210 දරන මාර්ග අයිතීන් ද සමග වේ.

මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 3056/28 හි ලියාපදිංචි වී ඇත.

එන්. ජේ. ඒදිරිසිංහ,
උසාවි කොමසාරිස්,
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

2014 දෙසැම්බර් මස 29 වැනි දින,
අංක 244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙණිය, නුගේගොඩ.
දුරකථන අංකය : 0777 453 463

01-359

**යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම කොට්ඨාසයේ නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීධුවළවු නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු වන එම් සී එම් රාෆීක් විසින් මැන සාදන ලද අංක 2035 සහ 2010.11.04 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 01 දරන බිම් කොටස

ප්‍රමාණය (අ. 0 රූඩ් 0 පර්. 7.01) පර්චස් හතයි දශම බිංදුවයි එකක්

විශාල ඉඩම් කැබැල්ල සහ වරිපනම් අංක දරන 33, 33/01, 33/02, 33/03 සහ 35 A දරන සාප්පු ගොඩනැගිලි ඇතුලු සෑම සියලු දේ සමග වේ. වැඩි විස්තර සඳහා 2014.09.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* පළවූ යෝජනා සම්මුතිය බලන්න.

මන්නාරම ප්‍රසිද්ධ නොතාරිස් එම් එම් සබූර්දීන් විසින් සහතික කරන ලද අංක 10389 සහ 2011.06.29 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය මීරාසහිබ් අබ්දුල් රහීම් *නොහොත්* මීරාසහිබූ අබ්දුල් රහිම්, අබ්දුල් රහීම් අජ්මල්ඛාන්, අබ්දුල් රහීම් අම්ජාඩීන්, අබ්දුල් රහීම් මොහොමඩ් අසර් බන්ධනදායින් වශයෙන් අබ්දුල් රහීම් *නොහොත්* මීරාසහිබූ අබ්දුල් රහීම් උකස්කරු වශයෙන් කොළඹ 03, ගාලු පාරේ අංක 64 හි පිහිටි යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම බන්දනදායින් වශයෙන් සහ පැහැර ඇති හෙයින්, යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2015 ක් වූ පෙබරවාරි මස 05 වැනි දින පෙ. ව. 11.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- මන්නාරම කෙලින් වීදියේ යූනියන් බැංකු ශාඛාව සිට දකුණු දිශාවට මීටර් 150ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත. මෙම දේපළ මන්නාරම නගර සභා කාර්යාලයට මුහුණ ලා පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය*.- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී, අංක 64, ගාළු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2374100.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය
සහ වාණිජ බැංකු
අංක 182, 3 වැනි මහල, හල්ස්ඩ්‍රෝප් වීදිය, කොළඹ 12
දුරකථන අංක 077- 3181891.

01-464

---

**යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීම

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවිල් පත්තුවේ, කළුවංචිකුඩි ගමෙහි පිහිටි ඊස්ටන් සීටන් එස්ටේට්/ගෘජ් නමැති බෙදා වෙන් කළ ඉඩම ප්‍රමාණය අක්කර 01, රූඩ් 0, පර්චස් 0

අක්කර එකක් විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේත් සමග මෙම ඉඩම අංක එච් 152/208 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම බලයලත් මිනින්දෝරු වී රාජේන්ද්‍රන් විසින් ඇද සාදන ලද අංක R/010/2011 සහ 2011.01.03 දිනැති මානක පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පලාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවිල් පත්තුවේ මන්මුනායි දකුණු එරාවිල් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මන්මුනායි දකුණු එරාවිල් පත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ කළුවංචිකුඩි ගමේ පිහිටි ඊස්ටන් සීටන් නමැති බෙදා වෙන් කළ ඉඩමට බලයලත් මිනින්දෝරු වී රාජේන්ද්‍රන් විසින් ඇද සාදන ලද අංක R/010/2011 සහ 2011.01.03 දිනැති මානක පිඹුර ප්‍රකාර ඉඩම

ප්‍රමාණය අක්කර 01, රූඩ් 00, පර්චස් 00
අක්කර එකක් හෙවත් හෙක්ටයාර් 0.4047 විශාල ඉඩම් ගොඩනැගිලි ළිඳ ඇතුලු ඊට අයිති සෑම සියලු දේත් සමග

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී කනගරත්නම් විසින් සහතික කරන ලද අංක 5091 සහ 2011.09.21 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය "වරදරාජා රෝහිණී" යන අය බන්ධනදායි/උකස්කරු

වශයෙන් කොළඹ 03, ගාලු පාරේ අංක 64 හි යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී "වරදරාජා රෝහිණී" විසින් පැහැර ඇති හෙයින් යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව 2015ක් වූ පෙබරවාරි මස 10 වැනි දින පෙ. ව. 10.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- මඩකලපුව යුනියන් බැංකුවේ සිට ත්‍රිකුණාමලය පාරේ කි. මී. 1/2ක් පමණ ගමන් කළ විට දකුණට ඇති බාර් පාර සහ කල්මුනෙයි පාරේ කි. මී. 26ක් පමණ ගමන් කළ විට කළුවංචිකුඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුව පසුකොට පන්සල තෙක් ගමන් කොට වමට ඇති ගුරු පාරට හැරී මීටර් 30ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ ශක්ති ඉල්ලම් පාරේ හන්දිය අසල පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.*- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරණ වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී, අංක 64, ගාළු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2374100.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය
සහ වාණිජ බැංකු.
අංක 182, 3 වැනි මහල, හල්ස්ඩ්‍රෝෆ් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 077- 3181891.

01-465

---

**යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, උතුරු වලිකාමත් කොට්ඨාසයේ මල්ලකම් පත්තුවේ එර්ලලායි ගමේ පිහිටි "කරුකම්පනෙයි හෙවත් කරුවෙම්බන් සප්පිද්දියන්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී මහෙන්ද්‍රන් විසින් මැන සාදන ලද අංක 940 සහ 2011.04.23 දින දරන මානක පිඹුරේ කැබලි අංක 1 වශයෙන් නිරූපිත ප්‍රමාණයෙන් එකම ඉඩමක් වශයෙන් සංගෘහිත සහ ප්‍රමාණයෙන් 1Lms V. C. සහ 04.40 Kls විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ළිඳ නිවස සාප්පුව ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියලු දේත් සමගය.

වැඩි විස්තර සඳහා 2014.08.01 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළවූ යෝජනා සම්මුතිය බලන්න.

යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එස්.සිවපාදම් විසින් සහතික කරන ලද අංක 5194 සහ 2011.08.15 වැනි දින දරන මූලික උකස් බැදුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය කදිරවේලු බාලරන්ජන් සහ බාලරන්ජන් තදීස්වරී බන්ධනදායීන් වශයෙන් කොළඹ 03, ගාලු පාරේ අංක 64 හි පිහිටි යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැදුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් එකී බන්ධනදායීන් විසින් පැහැර හැර ඇති හෙයින්, යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2015 ක් වූ පෙබරවාරි මස 06 වැනි දින පෙ. ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- මල්ලකාම් පාරේ නැගෙනහිර දිශාවට මල්ලකාම් හන්දිය සිට කි. මී. 0.50 පමණ ගමන් කළ විට වල්ලයි පාර හමුවේ. එතැන් සිට මීටර් 250ක් පමණ වල්ලයි පාරේ ගමන් කරන විට අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.*- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී. අංක 64, ගාළු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2374100.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය
සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල, හල්ස්ඩ්‍රෝෆ් වීදිය, කොළඹ 12
දුරකථන අංක 077- 3181891.

01-466

### යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා බල සීමාවේ කෙසෙල්වත්ත උප කාර්යාල සීමාවේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 674 දරන ගොරකපොල ග්‍රාම සේවා නිලධාරී වසමේ ගොරකපොල පිහිටි එස් ජී කුරුප්පු මාවතේ වරිපනම් අංක 275/53 දරන රතුවත්ත කුරුඳුවත්ත උළුගේවත්ත පාවුල ඕවිට සහ මොරගහවත්ත හෙවත් කෝන්ගහවත්ත පහෙත් එක් පංගුවක කොටසක් වශයෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු බී එල් ඩී ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 6401 සහ 2002 සැප්තැම්බර් මස 28 වැනි දින දරන මානක පිඹුර ප්‍රකාර බිම් කොටස.

ප්‍රමාණය (අ. 0 රූ. 0 පර්. 37.90) පර්චස් තිස් හතයි දශම නවයයි බිංදුවක් හෙවත් හෙක්ටයාර් 0.09589 විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියළුදේත් සමගය. වැඩි විස්තර සඳහා 2014.10.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* පළවූ යෝජනා සම්මුතිය බලන්න.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. සී. පීරිස් විසින් සහතික කරන ලද අංක 121 සහ 2013 ජුනි මස 20 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය නම්මුනි කමල් නිශාන්ත ද සොයිසා බන්ධනදායි වශයෙන් කොළඹ 03, ගාලු පාරේ අංක 64 හි පිහිටි යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදායි විසින් පැහැර ඇති හෙයින්, යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2015 ක් වූ පෙබරවාරි මස 12 වැනි දින පෙ. ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- කොළඹ කොටුව සිට මොරටුව නගරය දෙසට ගමන් කළ විට පරණ ගාලු පාරේ කෙසෙල්වත්ත පොලිසිය පසු කර කි. මී. 23 කණුව පසු කර මීටර් 700ක් පමණ ගමන් කර වමට ඇති ඒ එස් ජී කුරුප්පු මාවතට හැරී මීටර් කීපයක් ගමන් කළ විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.*- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, යූනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී, අංක 64, ගාළු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2374100.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය
සහ වාණිජ බැංකු
අංක 182, 3 වැනි මහල, හල්ස්ඩෝෆ් වීදිය, කොළඹ 12
දුරකථන අංක 077- 3181891.

01-467

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් නිවේදනයයි

බලපිටිය ට්‍රේඩර්ස්
ගිණුම් අංක : 0035 1000 1345

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2005.05.26 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් හතර ලක්ෂ හත් දහස් පන්සිය පනස් දෙකයි ශත හැට අටක (රු. 34,07,552.68) මුදලින් ගෙවන ලද මුදල අඩු කරන ලදුව දැනට ගෙවීමට ඇති රුපියල් පහලොස් ලක්ෂ හැත්තෑ හත් දහස් හයසිය අසූහයයි ශත එකොළහක මුදල ද, 2005 පෙබරවාරි මස 01 වැනි දින සිට අංක 241 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි පන් ලක්ෂයක (රු. 2,500,000) මුදලක් සඳහා 2005 පෙබරවාරි මස 01 වැනි දින සිට වාර්ෂිකව සියයට දහ තුනක් (13%) හා තවත් රුපියල් පහලොස් ලක්ෂ හැත්තෑ හත් දහස් හයසිය අසූ හයයි ශත එකොළහක අඩුකළ (රු. 15,77,686.11) මුදලක් සඳහා 2012 අප්‍රේල් මස 01 වැනි දින සිට වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දෙපළ සහ පරිශ්‍රයන් 2005.10.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2005.10.03 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්' දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2015.02.05 වැනි දින අංක 1432 දරන පිඹුරෙහි ලොට් 1 පෙ. ව. 11.00 අංක 1794 දරන පිඹුරෙහි ලොට් ඒ මධ්‍යාහ්න 12.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ

බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලවිට කෝරළේ සහ බලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වැලිතර බ්‍රාහ්ක්මණවත්ත ග්‍රාමයේ ගාලු පාරේ වරිපනම් අංක 144 දරන ස්ථානයේ පිහිටි එට්ටලවත්ත කොටස් 2 යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී. ටී. ද එස්. මනුකුලසූරිය යන අය විසින් සාදන ලද 2001 මාර්තු මස 01 දාතම හා අංක 1794 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : හෙන්දහේවා පේදිරිස් සහ වෙනත් අයට අයිති ඉඩම සහ බස්නාහිරට : වැලිබොඩ මහවත්ත නොහොත් කපුගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අ. 0 රූ. 0 පර්. 11) විශාල ඉඩම් කොටස සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 1794 දරන පිඹුරට අනුවය.

එකී ඉඩම පහත සඳහන් පරිදි නැවත මිනුමකි :-

එකී වැලිතර බ්‍රාහ්ක්මණවත්ත ග්‍රාමයේ ගාලු පාරේ වරිපනම් අංක 144 දරන ස්ථානයේ පිහිටි එට්ටලවත්ත කොටස් 2 යයි කියනු ලබන සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අලගිඅත්ත වඩු සින්නප්පු යන අයට අයිති ඉඩම සහ නැගෙනහිරට : ප්‍රධාන පාර දකුණට : හෙන්දහේවා පේදිරිස් සහ වෙනත් අයට අයිති ඉඩම් බස්නාහිරට : වැලබොඩ මහවත්ත නොහොත් කපුගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම් කොටස සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ වෙළුම/පත්ඉරුව B 311/240 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන සී. ටී. ද එස්. මනුකුලසූරිය යන අය විසින් සාදන ලද 2011 මාර්තු මස 01 දාතම හා අංක 1794 දරන පිඹුර හා ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. බන්දුලරත්න යන අය විසින් ලියා සහතික කරන ලද 1986 සැප්තැම්බර් මස 14 දාතම හා අංක 3804 දරන එම සින්නක්කර ඔප්පුව මගින් හිමිකම් කියූ නැසීගිය ඉන්ද්‍රා මාලනී ද සිල්වා විවාහයට පෙර රත්නවීර යන අය විසින් පිළිවෙලින් විවාහ සහ මාපිය උරුමයෙන් හා ඒ යටතේ බුක්ති විඳි අයිතිය වේ.

2. එකී වැලිතර බ්‍රාහ්ක්මණවත්ත ග්‍රාමයේ ගාලු පාරේ වරිපනම් අංක 156 දරන ස්ථානයේ පිහිටි එට්ටලවත්ත ලොට් 8 සහ කපුගෙවත්ත ලොට් A ඒකාබද්ධ උප බෙදුමක් වශයෙන් හඳුන්වන ඉඩමට බලයලත් මානක තැන සී. ටී. ද එස්. මනුකුලසූරිය යන අය විසින් සාදන ලද 1997 නොවැම්බර් මස 29 දාතම හා අංක 1432 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වැල්ලබඩ මහවත්ත සහ එට්ටලවත්ත නැගෙනහිරට : ගාලු පාර දකුණට : පාලමලග මහවත්ත සහ බස්නාහිරට: වැල්ලබඩ මහවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි පහයි දශම තුනයි පහක් (අ. 0 රූ. 0 පර්. 25.35) විශාල ඉඩම් කොටස සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 1432 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව B 376/224 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-476